# අතිපූජනීය නා උයනේ ශ්‍රී අරියධම්ම අනුනායක මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගේ, ස්වයං ලිඛිත සුවිශේෂී ජීවන තොරතුරු සටහන්

## 06. පස්වන වර බුරුම රට එා ඖ ආරණ්‍යයේ වැඩසිටි සමය. කමටහන් විස්තරය.

\- 2010 ජනවාරි 05 සිට 2010 මාර්තු 18 දක්වා -

2553-

2010-01-05.

පා අවුක් භාවනා මධ්‍යස්ථානයට වැඩමවීමේ අරමුණ.
06-දින රන්ගුන් නගරයේ මධ්‍යස්ථානයට පැමිණීම - 07 දින උදේ
වාහන දෙකකින් පිටත්වී සවස 05.0 පමණ පා අවුක් භාවනා
මධ්‍යස්ථානයට පැමිණීම, පා අවුක් සයාඩෝ මාහිමියන්
වහන්සේ වැඳපුදාගැනීම. (මෙවර එක්ව පැමිණි සඟපිරිස
11-නමක් ගිහිපිරිස 4-දෙනෙකි)

මාස 6-ක විශේෂ වැඩසටහන සඳහා විශාල
සඟ පිරිසක් යෝගී ගිහිපිරිසක් ද යෙදී සිටිති (1500) පමණ.
සිංගප්පූරු කොමිටියේ පිරිස විශාල අනුග්‍රහයක් කරමින්
සිටි, ලංකාවෙන් පැමිණි පිරිසට මහත්සේ උපකාර කරයි.

මගේ අසනීප තත්වය මත තෙමසකින් ආපසු
එන්නට නියමිත නමුත් 6-මාසයම ගතකිරීමට
සිත පැවතිණි.

සතියකට වරක් දෙවරක් විදර්ශනාව සඳහා
උපදෙස් ලබමි. මුලසිට ලැබූ උපදෙස් කෙටියෙන්
සඳහන් කරමි.

(1) ධාතු කම්මට්ඨාන පටන්ගෙන වස්තුරූප - චතුසමුට්ඨාන්න
රූප කලාප කොට්ඨාශ 42. රූප කලාප වෙන වෙනම
වෙන් කොට බැලිය යුතුය.

(2) අජ්ඣත්ත බහිද්ධා රූප කලාප සියල්ල මෙනෙහි
කොට නිමවා ආධ්‍යාත්මික නාමධර්ම - ධ්‍යාන සියල්ල
මනෝද්වාරික කුසල අකුසල ජවනවීථි, පඤ්චද්වාරික
කුසල අකුසල ජවනවීථි සියල්ල ද බාහිර නාමධර්ම
සියල්ල ද දකිමින් මෙනෙහි කළයුතුය.

(3) රූප ධර්ම - නාමධර්ම එකක් පාසා ලක්ෂණ රස

පච්චුපට්ඨාන ~~~~ පදට්ඨාන සම්මර්ශනය කළයුතුය.

(4) නාම රූප පරම්පරාව අනුව අතීත භාව පහක් පමණ බලමින් පටිච්ච සමුප්පාදය හේතුවල සම්බන්ධතාව සම්මර්ශනය කළයුතුය.

(5) පටිච්ච සමුප්පාදය පඤ්චස්කන්ධ වශයෙන්ද ප්‍රථම ක්‍රමය අනුවද හේතුවල සම්මර්ශනය කළයුතුය.

(6) අජ්ඣත්ත බහිද්ධා නාමරූප සියල්ලෙත් අතීත භාව අනාගත භාව පරම්පරාවත් සම්පූර්ණයෙන් සම්මර්ශනය කළ යුතුය.

(7) චතු සමුට්ඨාන රූප කලාප සියල්ලෙත්, ශරීර ධාතු කොට්ඨාස 42. සම්බන්ධ රූප කලාපත්, පටිසන්ධි නාමරූප සිට චුතිය තෙක් මනෝද්වාරික - පඤ්චද්වාරික කුසල අකුසල චිත්තවීථි අනුව සියලු නාමධර්මත්, සියලු ධ්‍යාන චිත්තවීථි අනුව ධ්‍යාන නාමධර්මත්, එකින් එකට චත්තාලීසාකාර මහා විපස්සනාවට නංවා සම්මර්ශනය කළයුතුය

(8) රූප සත්තක - අරූප සත්තක අනුව සම්මර්ශනය කළයුතුය. ඉන් අනතුරුව සම්පූර්ණ ලෙස උදයව්‍යය සම්මර්ශනය කළයුතුය.

(9) පටිච්ච සමුප්පාද පඤ්චම ක්‍රමයත් ප්‍රථම ක්‍රමයත් දෙකම සමුදය වශයෙන් ත්‍රිලක්ෂණයට නැගිය යුතුය.

(10) නැවත නිරෝධවාර වශයෙනුත් – සමුදය නිරෝධවාර වශයෙනුත් ත්‍රිලක්ෂණය සම්මර්ශනය කළයුතුය - අජ්ඣත්ත බහිද්ධා නාමරූප සියල්ල එකක් පාසා – දුර්ගන්ධ - අශුචි ජාති, ජරාමරණ අසුභ වශයෙන් සම්මර්ශනය කළයුතුය

(11) අජ්ඣත්ත බහිද්ධා වස්තුරූප - ධාතු කොට්ඨාස රූපත් එසේම චිත්ත වීථි එකක් පාසා නාමධර්මත් එකක් පාසා ත්‍රිලක්ෂණයටත් අසුභයටත් නගමින් සංඝාත - ඝනසංඥාව සම්මර්ශනය කළයුතුය.

(12) අජ්ඣත්ත බහිද්ධා නාමරූප එකක් පාසා අනිච්ච දුක්ඛ අනාත්ම වශයෙන් වෙන වෙනම විදර්ශනා කරමින් විදර්ශනා කළ නාමධර්ම නැවත විදර්ශනා කළයුතුය.

(13) වස්තුරූප - රූපකලාප - කොටස් 42 හි රූප කලාප - චිත්තවීථියක් පාසා චිත්ත චෛතසික ධර්ම - සියලු ධ්‍යාන සමාපත්ති සමවැදී එක එකක් පාසා ධ්‍යානාංග - ධ්‍යාන සම්ප්‍රයුක්ත ධර්මත් - මේ සියල්ල එකක් පාසා වෙන වෙනම අනිත්‍ය - දුක්ඛ - අනාත්ම වශයෙන් විදර්ශනා කොට එකින් එකට විදර්ශනා කළ විදර්ශනා ඥානත් ත්‍රිලක්ෂණයට නගමින් සම්මර්ශනය කළයුතුයි.

(14) ඉහත සඳහන් ධර්මතා සියල්ල නැවත නැවතත් එකින් එක අනුපද විදර්ශනාවට නගමින් සම්මර්ශනය කළයුතුයි. ලංකාවට පැමිණීමට පසු සම්පූර්ණ කරන ලෙසත් අනුශාසනා ලැබිණි.

2010. 03. 16. දින පූජනීය වයිකාමි - වෙමෙයු - මොලමයින් ස්ථාන 4 ක් වන්දනා කෙළෙමු.

17. පූජනීය සෙයාඩෝ මාතිවියාන් වහන්සේට පූජා සත්කාර කොට_

ශ්‍රී ලංකාවට පැමිණ කිරීම පිණිස ආරාධනා කෙළෙමු. ආරාධනාව දැක්වෙමින් පිළිගත් සේක. ඒ සම්බන්ධ ලිපියක් එවන ලෙසද අවසර ලැබිණි. එය ලියුමෙන් පසුව දන්වන පිළිතුරකි.

මෙහි සැවැස ලංකාවෙන් පැමිණි සෑම පිරිස හා එක්ව සිටි ආවාසයට පිවිසියේ සවස 6.00. මුල් ග්‍රෝතයටම යොදවන සෙත් පිරිත් දේශනයක් පැවැත්වීමු.

2010/03/18 වන දින ඒ ආරාම භාවනා මධ්‍යස්ථානයෙන් සමුගෙන රජගුරු බලා නායක දෙකක් වැනි ගමන් ශාක්‍යමුනි පූජනීය සිද්ධස්ථානයට පැමිණ චිරං මල් සුදුපුටු එවත් පී ලේගු නුවර කැම්බුඩෝ මහතුගේ පුදුපුටු රාත්‍රී 9-05. තායි ලෙයි සනවිනා මධ්‍යස්ථානයට පැමිණ වීමු.

19 - දින උදේ ශ්‍රී ලංකාරාමයටත් - ශ්‍රී ලංකා තානාපති කාර්යාලයටත් පැමිණ වී සවස 1-00. පිටත්ව 3-00 ට ගුවන් යානයෙන් මන්ඩලේ සිට මියනි - භාවනා මධ්‍යස්ථානයට පැමිණ වූයේ රාත්‍රී 7.00 ට පමණය.

20. වන දින උදේ වරුවේ උල්ලිඛිය උදුම්පාලතන් පසිය වරුවේ මාණ්ඩලේ කල්‍යාණ විහාරමත් ආපිරිමත් බාවල් බුද්ධ - විහාරමත් පැමිණ වී වැඳුම්පිදුම් කළෙමු.

රාත්‍රී 7-30 - සිට 9.00 තෙක් මධ්‍යස්ථානයේ යෝගීන් වහන්සේට ධර්ම දේශනයක් ධර්ම සාකච්ඡාවක් පැවැත්වී විය.

Acc No - 747640
Date 2016/12/30
Dept. of National Archives